# මා දුටු සුන්දර සිහිනය



නදිනි අමා නෙත්මිණි

# මා දුටු
# සුන්දර සිහිනය

## නදිනි අමා නෙත්මිණි

## 2025.01.30

ISBN අංකය : 978-624-208-258-5

# පිදුම

මාගේ ආදරණීය

අම්මාටත්, තාත්තාටත්

නැණ නුවණ පහදා දෙන

ගුරු මෑණිවරුන්ටත්,

පියවරුන්ටත්

මෙම පොත

ගෞරවයෙන් පුදමි!



# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය සිසු ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතා කරදන අත්ථදස්සී මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යලි ගොඩ නගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරෙණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාව රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක්ද ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවදියේම තම සහජ කුසලතා හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධිර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# පටුන

මා දුටු සුන්දර සිහිනය 01 - 06


# මා දුටු සුන්දර සිහිනය

හිමිදිරියේ කන්ද උඩින් හිරු කුමරා පායා එයි.

මම ඒ සුන්දර උදෑසනම එළියට බැස්සෙමි.

හාතාවාරිය වැලේ කුරුල්ලෝ ජෝඩුවක් කීචි බීචි ගාමින් සිටිති.





කුරුල්ලා පරඬැල් වර්ග, කෝටු කෑලි සැරින් සැරේ ගෙනවිත් කිරිල්ලීට දුන්නේ ය.

ඒවාගෙන් කිරිල්ලී කුරුලු කූඩුවෙන් තරමක් සාධා නිම කළා ය.

දවස නිමා කරමින් හිරු කුමරු සැන්දෑ අහසේ ගිලී ගියේ ය.

කුරුල්ලන්ගේ සුන්දර දසුන බැලීම අවසන් කළ මටද පාළු සිතුණි.



පසුදා ද කුරුල්ලන් බලා ගැනීමේ බලාපොරොත්තුවෙන් මම ගෙට ගොඩ වුණෙමි.



තවත් දිනකට ඉර උදාවිය පෙර දින වාගේම කුරුල්ලා පරඬැල්, කෝටු කෑලි ගෙනවිත් දුන්නේය. කිරිල්ලී ඒ වාගෙන් කූඩුව සෑදීමට පටන් ගත්තාය.





දින කිහිපයක් ගතවිය. කූඩුව සාදා නිම විය.

තවත් ටික දවසක් ගතවිය. කිරිල්ලි බිත්තර දා බිත්තර රකිමින් සිටිනු මම දුටුවෙමි.

දවසක් කුරුල්ලයි කිරිල්ලී කෑ ගසනවා ඇසුනි.

මම දුවගොස් බැලූ විට ගැරඩියෙක් ගස දිගේ නගිනවා දුටුවෙමි. විගස මම ඌ එලවා දැමුවෙමි.



තව දවසක කීච් බීච් සද්දයක් මට ඇසුනි.



කුරුළු පැටවුන් තුන්දෙනෙක් කූඩුවේ සිටිනවා මම දුටුවෙමි.

ටික දවසක් ගිය විට උන් තටු ගසා පියාඹනවා මම දුටු වෙමි.



මගේ සිතට නිම් හිම් නැති සතුටක් ඇති විය.

# පසුවදන

රටේ අනාගතයේ සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යමය ප්‍රබෝධයක් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයෙකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ එලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කළාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුයි.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මේවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවෙකුටත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයින් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවිය මාගේ සුභාෂින්සන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්